# වසර 2008 ඕස්ට්‍රේලියානු නර්තන සම්මාන උළෙලට ශ්‍රී ලාංකීය සාම්ප්‍රදායික නර්තනය නැවුම් මුහුණුවරින් නව රිද්මයකට

### රංගන- උදුම්බරා නර්තන කණ්ඩායමෙන්



ප්‍රථම වරට මෙල්බන්හි, "ඕස්ට්‍රේලියානු නර්තන සම්මාන උළෙල" (The Australian Dance Awards Ceremony) පැවැත්වීමට ඕස්ට්‍රේලියානු නර්තන සමාගම (Ausdance Victoria) කටයුතු යොදා ඇත.

මෙම මංගල කටයුත්ත මෙල්බන්හි සැමරීම සඳහා ඕස්ට්‍රේලියානු නර්තන සමාගම මෙල්බන් පුරා විසිරී සිටින බහු සංස්කෘතික නර්තන කණ්ඩායම් රාශියකගෙන් තෝරා ගත් තරුණ නර්තන කණ්ඩායම් (වයස අවුරු 15-25 දක්වා) 5කින් "නැවුම් නර්තනය නව රිද්මයකට" (Fresh Dance New Beats) යන මාතෘකාව යටතේ නව මුහුණුවරක් ගත් නර්තන ප්‍රසංගයක් සංවිධානය කර ඇත.

මෙහි ඇති වැදගත්කම වන්නේ යම් තෝරා ගත් සංස්කෘතික නර්තන කණ්ඩායම්, තමන් අළුතින් ඉගෙන ගැනීමට කැමති බටහිර නර්තන සම්ප්‍රදායක් තෝරා ගත් විට, ඕස්ට්‍රේලියානු නර්තන සමාගම මගින් මෙල්බන්හි එම සම්ප්‍රදායේ නිපුන වෘත්තීමය නර්තන ශිල්පියෙකු/ ශිල්පිනියක එම නර්තන කණ්ඩායමට ලබා දිමය. එමගින් ඔවුන් බලාපෙරොත්තු වන්නේ. එම වෘත්තීමය නර්තන ශිල්පියා/ ශිල්පිනිය සමඟ එකතුව මුලින් සඳහන් කල සංස්කෘතික නර්තන කණ්ඩායම නිර්මාණය කරන නව නර්තන අංශය, සාම්ප්‍රදායික නර්තනය, 'නව නර්තන සම්ප්‍රදායක්' සමඟ සංයෝජනය කිරීමේ අභියෝගය ජය ගැනීමය.

මෙල්බන්හි ප්‍රථම වරට සංවිධානය වන මෙම අනගිභවනීය අවස්ථාවට තේරී පත්වීමේ භාග්‍ය මෙහි වෙසෙන අපගේ නර්තන කණ්ඩායමටත් උදා වී ඇත. ඒ ශ්‍රී ලාංකික අප කවුරුත් හොඳින් අඳුනන රංගන-උදුම්බරා නර්තන කණ්ඩායමයි. ඔවුන් මෙම අභියෝගය බාර ගෙන මෙල්බන්හි ප්‍රථම පෙළේ 'Contemoprary Dance' ශිල්පිනිය වන Fiona Cameron සමග එකතුව ශ්‍රී ලාංකීය සාම්ප්‍රදයික නර්තනය බටහිර සමකාලීන නුතන නර්තනය ^Contemoprary Dance) සමග මුසුකොට නව නිර්මාණාත්මක නර්තන අගයක් සුදානම් කරමින් පසුවෙති.

Fiona Cameron ඕස්ට්‍රේලියාවේ සහ යුරෝපයේ වෘත්තීමය නර්තන ශිල්පිනියක් මෙන්ම රංගවින්‍යාසය (Choreography) පිළිබඳ විශේෂඥ දැනුමක් ඇත්තියකි. ඇය මෙල්බන්හි "Chunky Move" යන නර්තන සමාගමෙහි වෘත්තීමය නර්තන ශිල්පිනියක් ලෙස කටයුතු කරන්නීය.

රංගන-උදුම්බරා නර්තන කණ්ඩායමක් සමග ඇය මෙම කර්තව්‍යට මුල පුරා ඇත්තේ ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදය පිළිබඳ ඇයගේද ප්‍රථම අත්දැකීම ලෙසය. මෙම නර්තන අංශයේ තේමාව ලෙස උදුම්බරා සඳහන් කලේ, පෙරදිග හා බටහිර සංස්කෘතික ඝට්ටනය ඇය මෙම නිර්මාණය තුලින් එළිදැක්වීමට බලාපොරොත්තු වන බවයි. උදාහරණයක් ලෙස තරුණ වියේ පසුවන ළමයින්ට මෙම රටේදී විඳින්න වන අත්දැකිම්, ගෙදර පරිසරය තම සංස්කෘතිය තුල හිර කරන්නට වෙර දරද්දී අවට ලෝකය වෙනත් දිසාවකට ඔවුන්ව ඇදගෙන යාම "මෙහිදි මට, මා දැනට කථිකාචාරිනියක ලෙස රැකියාවෙහි නියුතු මෙල්බන් විශ්වවිද්‍යාලයේ වික්ටෝරියානු නර්තන ආයතනයේ මා සමගත් ශ්‍රී ලාංකීය නර්තන සම්ප්‍රදය හදාරන ඕස්ට්‍රේලියානු ජාතික ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමග අපගේ නර්තන කණ්ඩායමේ ශිෂ්‍යාවන්ද සහභාගි කර ගැනිමට හැකි වීම මගේ තේමාවට වඩාත් යෝග්‍ය වුවා යැයි මම විශ්වාස කරනවා. Fiona, මම මා රංගන එකතුව නිර්මාණය කරන අතර නර්තන අංශය තුලින් අප බලාපොරොත්තු වන්නේ සාම්ප්‍රදයික ශ්‍රී ලාංකීය නර්තනය සමකාලින නුතන නර්තනයයි ^Contemoprary Dance), නැටුම් අනුසාරයෙන් කථාවක් කිවීමේ මාවත කෙතරම් දුරට විවර කරනවාද යන්නයි.

ඕස්ට්‍රේලියානු නර්තන සමාගම "Fresh DANCE New Bests" යන තේමාව යොදගෙන ඇත්තේ ද, සම්ප්‍රදයික නර්තනය නව නර්තන සම්ප්‍රදයක් සමග සංකලනය කර නිර්මාණය වන මෙම නව නිසාමය. ශ්‍රී ලාංකීය අපට ඉන්දියානු චිත්‍රපට නර්තනයන් අනුකරනය නොකොට, අපේම කියා ආඩම්බරයෙන් පෙන්විය හැකි අපටම උරුම වූ අසම සම වූ නර්තන සම්ප්‍රදායක් තිබෙනවා. ඒ උරුමය බටහිර රටක ජීවත්වන අය හැටියට ඕස්ට්‍රේලියානු ජාතිකයාට ගෙන යාමේ අභියෝගය ජය ගැනීමයි අපි දෙන්නගේ උත්සහය. පසුගිය වසරේ බොනෑස් ප්‍රසන්ගයේ ඉදිරිපත් කළ සුදු ජාතික ළමුන්ගේ නර්තන අංශය තුලින් ප්‍රථම වරට එය අප ඔප්පු කර පෙන්වා තිබෙනවා. මේ අපගේ තුන්වන උත්සහයයි. අපි අපේ උතුම් රටෙන් ඉගෙන ගත් ඒ නැවුම් සම්ප්‍රදායට හා ඒ ගුරු භවතුන්ට අපට කිරීමට හැකි ලොකුම උපහරෙයත් එය කියලයි අපි විශ්වාස කරන්නේ. අපගේ රංගන - උදුම්බරා නර්තන කණ්ඩායමේ පරමාර්ථයත් එයයි.

රංගන හා උදුම්බරා අප සමග අවසාන වරට පැවසුවේ එයයි.

අපගේ නර්තන කණ්ඩායමකට මෙම අවස්ථාවට සහභාගි වීමට ලැබීම ශ්‍රී ලාංකිකයන් ලෙස අපට ද මහත් ආඩම්බරයකි.

ඕස්ට්‍රේලියානු නර්තන සමාගම (Añdance Victoria) වෙසෙන්නේ, "Fresh Dance New Beats" යනු සාම්ප්‍රදායික නර්තනය, සමකාලීන නර්තන රාමුව තුල දැක ගැනීමට ලැබෙන අනගි අවස්ථාවක් ලෙසයි.

මෙය මෙල්බන් Arts Center ys ANZ Pavilion හිදී ජූනි මස 15 වන ඉරු දින දහවල් 12.30 සහ 2.30 ට දර්ශන වාර 2ක් පැවැත්වේ.

ඕස්ට්‍රේලියානු නර්තන සම්මාන උළෙල මෙල්බන් හි පැවැත්වෙන ප්‍රථම වතාව බැවින්, Ausdance Victoria මගින් මෙය නොමිලේ ප්‍රදර්ශනය කරන බවයි උදුම්බරා අප සමග පැවසුවේ. ඒ සමගම ශ්‍රී ලාංකීය නර්තන ලෝලී සැමටම මෙම ඓතිහාසික අවස්ථාව විඳගැනීම සඳහා එදිනට පැමිණෙන ලෙසට රංගන - උදුම්බරා නර්ථන කණ්ඩායම පාඨක ඔබ සැමට ආරාධනා කර සිටී. වැඩි විස්තර සඳහා අමතන්න : උදුම්බරා - 03 - 3558 6578 / 0417 149 136

WANT TO GET PR...?

ONSHORE STUDENT
Two year Australian
Degree / Diploma ?
or
Worked within last one year

OFFSHORE Skilled Migration
Degree Holders.
CIMA, CIM, ACCA, ICASL, ABE
Banking Diploma ATI, TTI, NIATA
German Tech & Experience

OTHER MIGRATION
Business Owners & Investors/ Visitors/ Spouse/ Students
Parents and all other categories

EASY PAYMENT TERMS
MONEY BACK GUARANTEED*
*Conditions apply

➡ Blood relatives in Australia it is an advantage
➡ Below the age of 45 years & have a good knowledge of English

No consultation over the phone

YOUR APPLICATION IS IN EXPERIENCED AND RELIABLE HANDS

Contact
Hirosh Hemantha Gamage ASA, AAIBE (Snr.) MMIA
(Registered Migration Agent No:0320696)
And
Peter Russell Loughton (MARN 9789986)

MIA
MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

ඕස්ට්‍රේලියාවේ දී
MULTINATIONAL MIGRATIONS SERVICES
4/45 Ancona Drive, Mill Park
Victoria 3082, Australia
Tel: +61 3 94377384
Fax: +61 3 94378203

ශ්‍රී ලංකාවේ දී
AUSTRALIAN MIGRATION SERVICES
245 (3rd Floor) Dharmapala Mawatha
Colombo 07, Sri Lanka
Tel: +94 11 5 500100
Fax: +94 11 2 697243

ඔස්ට්‍රේලියාවේ පුවත්පතක කොටස් වශයෙන් පළ වූ පළමු සිංහල නවකතාව දැන් දයාවංශ ජයකොඩි සමාගමේ පොතක් ලෙස

ජගත් ජේ එදිරිසිංහ ලියා
සිතිජය නමින් පහන මාසිකයේ කොටස් වශයෙන් පළ වූ
ජනප්‍රිය නවකතාව




තැපෑලෙන් ලබා ගැනීමට
සූරිය මාකටිං සර්විසස්
22 Lorne Street Lalor
Vic 3075 Australia
දුරකතන 613 9402 5380

දයාවංශ ජයකොඩි සහ සමාගම